**13 ශ්‍රේණිය ව්‍යාපාර අධ්‍යයනය 7 වන සතිය - ජූනි 15 සිට 19 දක්වා**

**17.2 ව්‍යාපාරයක තොරතුරු පද්ධතියක ඇති වැදගත්කම හා කාර්යභාරය විමසයි.**

- **තොරතුරු පද්ධති** - ව්‍යාපාරයක තීරණ ගැනීම හා පාලනය සඳහා අවශ්‍ය වන තොරතුරු රැස් කිරීම,සැකසීම,ගබඩා කිරීම හා බෙදා හැරීම සඳහා වූ අන්තර් සම්බන්ධතාවකින් යුත් උපාංග සමූහයක එකතුවකි.

- තොරතුරු පද්ධතියක් මගින් දත්ත තොරතුරු බවට පත් කෙරේ.

  දත්ත තොරතුරු බවට පත් කිරීමේ උපාංග පහත දැක්වේ.

  **ආදානය** - තොරතුරු පද්ධතිය සඳහා අවශ්‍ය දත්ත එකතු කිරීම ආදානය යන්නෙන් අදහස් වේ.

  **සැකසීම** - එකතු කරන ලද දත්ත තොරතුරක් බවට පත් කිරීමේ ක්‍රියාවලියයි.

  **ප්‍රතිදානය** - දත්ත සැකසුම් ක්‍රියාවලිය මගින් සකසන ලද තොරතුරු අවශ්‍ය,අදාළ පාර්ශවයන්ට ලබා දීම ප්‍රතිදානයයි.

  **ගබඩා කිරීම** - පද්ධතිය ජනිත කළ තොරතුරු පසුව ප්‍රයෝජනයට ගැනීම සඳහා ආරක්ෂිතව ගබඩා කර තබා ගැනීමයි.

  **ප්‍රතිපෝෂණය** - අදාළ පාර්ශවයන්ට ප්‍රතිදාන යොමු කිරීම මගින් ආදාන ඇගයීම හෝ අදහස් විමසීම හෝ ප්‍රතිපෝෂණයයි.

  **අභ්‍යාස**

  1.පරිගණක ගත කරන ලද තොරතුරු පද්ධතියක ඇති උපාංග නම් කරන්න.
  2.තොරතුරු පද්ධතියක අවශ්‍යතාවය/වැදගත්කම පහදන්න.